2013 පෙබරවාරි 15 වැනි දා 'කලම්බු ටෙලිග්‍රාෆ්' වෙබ් අඩවියේ පළවූ
Do You Know the Way To Latimer House?
නැමති ලිපියේ සිංහල පරිවර්තනය
'යහපාලනය ලංකා' වෙතින්

# 'ලැටිම(ර්) නිවෙසට' යන පාර ඔබ දන්නවා ද?

රවි පෙරේරා

සැන් හොසේ යන්නේ කෙසේ ද යි වඩාත් මිහිරකින් ඇසිය හැකිව තිබිය දී, ලැටිම(ර්) නිවෙසට යන්නේ කෙසේ ද යි ඇසීමට ලංකාවේ වෙසෙන්නන්ට බරපතල හදිසියක් ඇතැ යි පෙනේ. ගතවූ දෙමස තිස්සේ, බොහොමයක් දෙනා= විද්වතුන් සහ හුදී භවතුන් පමණක් නොව= ලැටිම(ර්) සහ ලැට්‍රින් (වැසිකිළිය) අතර වෙනසවත් නොදන්නා ඇතැමුන් ද, එංගලන්තයේ පිහිටි ඒ සුවිශේෂ නිවෙසට (ලැටිම(ර්) හවුස් යනුවෙන් හැඳින්වෙන ප්‍රතිපත්තිවලට) වැටී ඇති මාර්ගය විස්තර කිරීමට තතනන සැටි අපි දුටුවෙමු. විරුද්ධ පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ වැනි කීර්තිමතුන් මෙන්ම, හිටපු විදේශ කටයුතු අමාත්‍ය රෝහිත බෝගොල්ලාගම වැන්නන් ද, මේ නිවසේ වැදගත්කම, බ්‍රිතාන්‍යයෙන් කිලෝ මීටර් 8500 ක් මෙපිටින් වෙසෙන අපට කියාදීමේ බර උසුළන ලදී.

අපේ පශ්චාත්=යටත්විජිතවාදී පැවැත්ම තුළ, විශේෂයෙන් පාර්ලිමේන්තුව සහ අධිකරණය වැනි විදේශ ආයතනවල සම්ප්‍රදායයන්, පූර්වාදර්ශයන් සහ මෙහෙයුම් ක්‍රමවේදයන් අපේ වර්තමාන ආයතන කෙරෙහි වැදගත් අදාළත්වයකින් යුක්ත බව අමුතුවෙන් කිව යුතු නොවේ. උදාහරණයක් වශයෙන්, අපේ පාර්ලිමේන්තුවේ උද්ගත වන යම් ගැටළුවක් අරභයා පැහැදිලි නියාමන රෙගුලාසි සොයා ගැනීමට නැතොත්, ඊට ආදාළ මාර්ගෝපදේශකත්වය පතා අප යන්නේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ව්‍යවහාරයන් වෙතට යි. ඒ ආකාරයෙන්ම, නෛතික වශයෙන් අප බැඳී නැතත්, විදේශ අධිකරණ මගින් දෙන ලද තීන්දු අපේ අධිකරණ තුළ බලපෑම් සහගත වැදගත්කමක් උසුළයි. ඊට අමතරව, රටක් වශයෙන්, විටින් විට, ඇතැම් සම්මත ප්‍රමිතීන්ට අනුගත වීමට අපට බල කෙරෙන විවිධ ජාත්‍යන්තර ප්‍රඥප්තීන්ට අප අත්සන් කොට එකඟ වී තිබේ.

යුරෝපීය යටත්විජිතවාදය ඇරඹෙන්නට මත්තෙන්, ලෝකය ඉතා විශාල තැනක් විය. ඒ කාලයේ, ලංකාවේ උපන් කෙනෙකුට යුරෝපයට යාමක් ගැන සිතා ගැනීමටවත් නොහැක. ඒ සම්බන්ධයෙන් බලන කල, අනුරාධපුරයේ ජීවත් වූ කෙනෙකුට පවා මාතරට යාම සුළුපටු දෙයක් නොවුණි. දුර යනු සැබෑ ප්‍රත්‍යන්ත දේශයක්ම විය. ඒ කාලයේ අපේ ජනගහනය ලක්ෂ කිහිපයකට වැඩි නොවන්නට ඇත. ඉන් බොහොමයක් දෙනා වාසය කෙළේ, උතුරු මැද කෘෂිකාර්මික බිම්වල ය. දිවයිනේ විශාල කොටසක්, හොල්මන් රජයන, වනසීපාවුන් සරණ, පෙදෙසක් විය. එකල මාතරට යන මගියෙක්, වන ලැහැබ් දිගේ අඩි පාරවල් ඔස්සේ මං සොයාගෙන යන්නට ඇති. එවැනි සංචාරයක්, නිර්භීතම කෙනෙකු ජීවිතේට එක වරක් පමණක් අතගසන වීර චාරිකාවක් වූවාට සැක නැත.

අතීතයේ ලෝකයේ විවිධ තැන්වල ස්ථාපිතව පැවති විවිධ ශිෂ්ටාචාර අනෙක් ශිෂ්ටාචාර පිළිබඳ යම් දැනුමක් ඇතිව සිටියේ නම් ඒ ඉතා අල්ප වශයෙනි. එක ශිෂ්ටාචාරයකින් තවත් ශිෂ්ටාචාරයකට කායික විපත්තියක් අත්නොවන තාක් කල්, එක ප්‍රජාවක ක්‍රියාවක් තවත් ප්‍රජාවකට වැදගත් නොවීය. එහෙත් යුරෝපා යටත්විජිතවාදයේ සියවස් පහක කාලය තුළ, ලෝකය විශාල වශයෙන් හැකිළුණි. මේ කියන බරපතල භෞතික හැකිළීමටත් වඩා, එකිනෙක ශිෂ්ටාචාරයේ අනන්‍යතාව සම්බන්ධයෙන් මෙන්ම, වෙනස් ජාතීන් සමග මුහුවීමේ අර්ථයෙන් ගත් විට තැනුණු මිනිසුන්ගේ මනෝ ලෝකය ඊටත් වඩා හැකිළුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මුළුමණින් වෙනස් සංස්කෘතියක සහ වෙනස් දේශගුණයක ජීවත් වූ ඉංග්‍රීසි විනිසුරුවරයෙකුට හුරුපුරුදු ලෝගු සහ සවරිවලින් තමන්ද සැරසීම ශ්‍රී ලංකාවේ විනිසුරුවරයෙකු තුළ මොනම විදිහකවත් චකිතයක් ඇති කෙළේ නැත. අපේ කතානායකවරයා (පාර්ලිමේන්තු සේවකයෙකු විසින් ඔසවාගෙන එනු ලබන සෙංකෝලය සමග), ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් සහ විරුද්ධ පක්ෂ මන්ත්‍රීවරුන් වෙන් වෙන්ව අසුන්ගෙන සිටින පාර්ලිමේන්තු සභා ගර්භයට පිවිසීමේ චතාවත තුළ කරන්නේ, සිය මුතුන්මිත්තන්ව ආයුධ බලයෙන් යටපත් කළ යුරෝපීය ජාතියකගේ සංකල්ප, සිරිත්විරිත් සහ සම්ප්‍රදායයන් අනුකරණය කිරීමකැ යි යන අප්‍රසන්න හැඟීමකින් කිසි විටෙකත් විඳවන්නේ නැත. ජාතික ඇඳුමෙන් සැරසුණු අපේ මන්ත්‍රීවරුන්, තේම්ස් නදිය අසළ පිහිටි අර මහා මන්දිරයේ මහතුන් සේම, පාර්ලිමේන්තු වරප්‍රසාද සහ බලතල පිළිබඳ රීති ප්‍රශ්න මතුකරනු අප කොතෙකුත් දැක ඇත.

එහෙත් මේ අනුගත වීම ඒ සා සරළ ද, පහසු ද? මුළුමණින්ම වෙනස් ඉතිහාසයක් සහ සංස්කෘතියක් ඇති, ලෝකය දෙස වෙනස් ආකාරයකින් බලන ජාතියක් සහ මුහුණුවරින් පවා වෙනස් ජාතියක්, තවත් ජාතියක ආකෘතීන් සහ ක්‍රියා පිළිවෙත්වල බාහිර අනුකාරකයින් වූ පමණින්, එම ආකෘතීන් සහ ක්‍රියා පිළිවෙත් පසුපස ඇති සාරය ප්‍රගුණ කිරීමට සමත් වේ ද? ඉංග්‍රීසීන් වූ කලී, ලෝක ව්‍යාප්ත අධිරාජ්‍යයක් තැනීමට පමණක් නොව, දිගුකාලීනව ඔරොත්තු දෙන සංකල්පාවලියක් සහ ආයතන පද්ධතියක් ඒ අධිරාජ්‍යය තුළ බිහි කිරීමටත් සමත් ජාතියක් වූ බව ඔප්පු කොට තිබේ. පාර්ලිමේන්තු, අධිකරණ, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, විද්‍යාත්මක ප්‍රගතීන්, සාහිත්‍යය සහ තවත් දහසකුත් දේවල්, වර්තමාන මානව පැවැත්මේ දියුණු අදියර අර්ථවත් කරන

මුල්ගල් බවට බොහෝ විට පත්ව තිබේ. ස්වකීය ශිෂ්ටාචාරය සඳහා ගැලපෙතැ යි ඉංග්‍රීසීන් විශ්වාස කළ එකී සංකල්ප සහ ආයතන අපටත් ඒ හා සමානවම ගැලපෙතැ යි අද වන විට ප්‍රශ්න කිරීමකින් තොරව අපි පිළිගමු.

මෙය එංගලන්තය සමග සැසඳීමකට ලක්කළොත්, එම රටේ වෙසෙන දේශපාලඥයෙකු නීති විරෝධී මාර්ගයෙන් මැතිවරණ ජයග්‍රහණය කිරීමේ හෝ ඒ සඳහා මැරවර බලය යෙදවීමේ හෝ තැනකට යොමු වෙතැ යි සිතා ගැනීමත් උගහට ය. එම සමාජයේ වෙසෙන කෙනෙකු පොදු කටයුතුවලට එළැඹෙන්නේ, පැහැදිළිවම, වෙනස් අභිප්‍රායයන් සහ සළකා බැලීම් පෙරදැරිව ය. වයස විසි ගණන්වල දී දේශපාලනයට පිවිස, අප්‍රාණික පැලැටි සේ වයස හැත්තෑ ගණන් වන තෙක් යාවජීව දේශපාලඥයන් වන මිනිසුන් එංගලන්තයේ සිටියොත් ඒ ඉතා කලාතුරකිනි. අපට වඩා බෙහෙවින් පොහොසත් රටක් වුවත්, මහජන ඡන්දයෙන් පත්වන්නන්ට ලැබෙන්නේ අල්ප ප්‍රතිලාභයකිඃ අද පවා, බොහෝ ඇමතිවරු, විනිසුරුවරු සහ වෙනත් ඉහළ පෙළේ රාජ්‍ය නිලධාරීන් සේවා ස්ථානවලට එන්නේ කෝච්චියෙනි. ඔවුන්ට සේවක සේනාවන් නැත. අපේ මෙන් ආරක්ෂක බලකායන් හෝ දේශපාලනික කාර්ය මණ්ඩල නැත. ජීවන ගුණාත්මක භාවය පිළිබඳ කෙරෙන ලද බොහෝ අධ්‍යයනයන්ට අනුව, එක්සත් රාජධානිය ඉදිරි පෙළේ සිටී. ඒ සමග සසඳද්දී අපට දකින්ට තිබෙන්නේ, ජේත්තුකාරයන්, මැරවරයන්, විකටයන්, වංචනිකයන් සහ තානාන්තර පස්සේ ලුහුබඳින නැට්ටුවන්ගේ පඩත්තල පෙරහැරකි. ශ්‍රී ලංකාවේ වෙසෙන එවැන්නන්ගේ සහකාරියන්ගේ/සහකරුවන්ගේ ජීවන රටා පවා, රටේ සෙසු ජනයාගේ ජීවන තත්ත්වයන් ඉදිරියේ නින්දිත ය. නිර්ලජ්ජී ය.

ලැටිම(ර්) හවුස් ප්‍රතිපත්ති ගැන ලියූ තවත් අය අතුරින් ඉහත කී මහතුන් දෙන්නා වෙතට ආපසු හැරෙන්නේ නම්, ඔවුන් බ්‍රිතාන්‍ය ආකෘතියේ ලා ගිණිය හැකි සැබෑ දේශපාලඥයන් යැයි හැඳින්විය හැකි අයවළුන් ද? රනිල් වික්‍රමසිංහගේ නායකත්වය යටතේ අත්ව ඇති පරාජයන් සහ වෙනත් අසාර්ථකත්වයන් තරමේ වාර්තාවක් ඇති කිසිවෙකු පක්ෂ නායකත්වයක එක දිගට රැඳුණු කිසි අවස්ථාවක් බ්‍රිතාන්‍ය ඉතිහාසය තුළින් අපට සොයාගත නොහැක. එහෙත් ලංකාවේ දී මෙකී සෑම පරාජයක්ම හේතු දක්වා සාධාරණීකරණය කොට ඊළඟ ජයග්‍රහණය ලබමි යි සපථ කෙරේ. රෝහිත බෝගොල්ලාගම පාර්ලිමේන්තුවට පත්වුණේ එක්සත් ජාතික පක්ෂ ඡන්දයෙනි. ඉන් පසු, ඇමතිකමක වරදාන භුක්ති විඳීමට ආණ්ඩුවට පැන්නේය.

විනිසුරුවරයෙකුට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන ඒමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට අවශ්‍ය කළත්, එම ක්‍රියාවලිය වෙනම සංස්කෘතියක් තුළ, වෙනම ලෝකයක් තුළ දිග හැරෙන්නකි. සමස්ත දෝෂාභියෝග පරිපාටිය තුළදීම, එරට මාධ්‍ය එඩිතර, උද්‍යෝගීමත් සහභාගීකරුවෙකු වෙනු ඇත. රටේ පාර්ලිමේන්තුවට අවශ්‍ය වන නිසාම පමණක් ඉහළ අධිකරණ විනිසුරුවරයෙකුට එරෙහිව දෝෂාභියෝගයක් පවත්වාගෙන යාමට බ්‍රිතාන්‍ය සමාජය ඉඩ හරිතැ යි සිතාගත නොහැක. ඔවුන්ගේ දේශපාලන පක්ෂ සහ මන්ත්‍රීවරු, මහජන මතයට සංවේදී වෙත්. සැබෑ අරුතින් ගත් කල්හි, දෝෂාභියෝගයක් යනු, කෙනෙකු වරදකට හසුකොට දඬුවමකට ලක්කිරීමේ 'අධිකරණමය ක්‍රියාවලියකි'. එවැන්නක්, පක්ෂයක අදහස් අනුව පාවිච්චි කෙරෙන මන්ත්‍රීවරුන්ගේ ඡන්දයකින් විනිශ්චය කළ යුත්තක් නොවේ. එසේම මෙවැනි අවස්ථාවක දී සිදුවන්නේ, බල විභේදනයට කෙලින්ම බලපාන ආකාරයෙන්, ආණ්ඩුවේ එක ආයතනයක් තවත් ආයතනයකට අතපෙවීම යි. එවැනි අවස්ථාවක්, මොන ක්‍රමයකින් හෝ ජයග්‍රහණය කැරැවීමේ අරමුණ පෙරදැරිව කෙරෙන ව්‍යාජ නඩු විභාගයකට භාර දිය යුතු නොවේ. මෙවැනි ක්‍රියාවලියකට එරෙහිව බ්‍රිතාන්‍යයේ ඇති ලොකුම ආරක්ෂණය වන්නේ, එම රටේ බොහෝ ආයතන පෝෂණය වී ඇති අරටු සාරධර්ම, සම්මත ප්‍රමිතීන් සහ සාධාරණත්වය පිළිබඳ හැඟීමකින් සමස්ත ක්‍රමය සජ්ජිත වීමයි.

හින්දුත්වවාදය මූලික වශයෙන් ඉන්දියානු ආගමක් වන නිසා එහි ආමන්ත්‍රණය වැඩිමනත් සීමාවන්නේ විශේෂිත ජන කොටසකට බව කෙනෙකු වරක් තර්ක කොට තිබුණි. තමා අවට දේවල් දෙස එක්තරා විදිහකින් බලන, එක්තරා විදිහකට කනබොන, අඳිනපළඳින, යනඑන සහ මුහුණුවරින් පවා හඳුනාගත හැකි එක්තරා පිරිසක් එම ආගමේ ආධ්‍යාත්මික හරයට ආකර්ශණය වෙත්. ඉන්දියානු උප=මහද්වීපයෙන් පිටස්තර වෙනත් හැදියාවකින් යුත් තවත් මිනිසුන් සහ වෙනත් ජාතීන් අතරේ හින්දුත්වවාදයට ආකර්ෂණයක් නැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙනත් රටවල්වලින් එම ආගමට හැරෙන්නන් දුලභ ය. ආගමික විශ්වාසයන් සම්බන්ධයෙන් මේ තර්කයේ ඇත්ත නැත්ත කෙසේ වෙතත්, ඒ ආකාරයෙන්ම, එක්සත් රාජධානියේ ආණ්ඩුකරණ ක්‍රියාවලිය විදහාපාන ව්‍යවස්ථාපිත ක්‍රම, පාර්ලිමේන්තු ක්‍රම සහ පොදු නීති පද්ධතිවලට අදාළ සංකල්පත් අපගේ වැනි සමාජ තුළ එවැනිම සාර්ථකත්වයකින් ක්‍රියාත්මක වේ ද යි සිතා බැලිය යුතුව තිබේ.

ලැටිම(ර්) නිවෙස වෙත යන ගමනේ දී පාර්ලිමේන්තු නිවස නමින් හැඳින්වෙන වඩාත් විශාල ගෘහයක් අපට හමු වේ. එසේ හෙයින්, ලැටිම(ර්) නිවසට යන පාර කිසි දවසක අපට හමු වේ ද?